*සැ. යු.* - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.08.26 දින පළ වූ අංක 1721 දරන ගැසට් පත්‍රයේ I-II(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,722 - 2011 සැප්තැම්බර් මස 02 වැනි සිකුරාදා - 2011.09.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1102 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1106 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1108 |


*සැ. යු.* - (i) ජයවික්‍රම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 ජූනි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ලේඛන ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත 2011 ජූනි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත 2011 අගෝස්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය** පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## වත්තල ප්‍රාදේශීය සභාව

වත්තල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පවතින 2011.07.29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ *ගැසට්* නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් භාර ගැනීමේ කාල සීමාව 2011.08.05 වැනි දින සිට 2011.09.30 වැනි දින දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වා සිටිමි.

එච්. එස්. අමරවංශ පෙරේරා,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

09-24

---

## ඉමදූව ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ ඉමදූව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දැක්වෙන කරුණුවලට අදාළ අයැදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර සභාපති, ප්‍රාදේශීය සභාව, ඉමදූව යන ලිපිනයට 2011.09.23 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආයුර්වේද සහායක | 02 | රා.ප.එ. 6/2006(iv) අනුව PL 1 2006 A<br>රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600. | (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් 05කින් සමත්ව අංක ගණිතය/ශුද්ධ අංක ගණිතය/වාණිජ්‍ය අංක ගණිතය/ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>(ii) නැතහොත් ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එකම වතාවකදී ගණිතය හා සිංහල/දෙමළ ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| 02 | රියදුරු | 02 | රා.ප.එ. 6/2006(iv) අනුව PL 3 2006 A<br>රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860 | (i) යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත්වීම හා යටත් පිරිසෙයින් එක් වසරක පළපුරුද්ද |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 | රා.ප.එ. 6/2006(iv) අනුව PL 1 2006 A<br>රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600. | (i) යටත් පිරිසෙයින් 08 වැනි ප්‍රමාණය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වීම |
| 04 | පුස්තකාල සහායක | 02 | රා.ප.එ. 6/2006(iv) අනුව PL 1 2006 A<br>රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600. | (i) යටත් පිරිසෙයින් 08 වැනි ප්‍රමාණය හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමත්වීම |

03. *වෙනත් සුදුසුකම්*:-

(i) දැනටමත් ඉමදූව ප්‍රාදේශීය සභාවේ ස්ථිර, අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.)
(ii) රියදුරු තනතුරට අයදුම් කරන අයට බරවාහන රියදුරු බලපත්‍රයක් සතුවීම අතිරේක සුදුසුකමක් වේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය :-

(i) අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසිඃ-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

06. වෙනත් පොදු කොන්දේසි ඃ-

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට දකුණු පළාත තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය)

(vi) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයැදුම්කරුවන් අයැදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.

(vii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට හා රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද දකුණු පළාත් සභාව හෝ ඉමදූව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

07. අයදුම්කළ යුතු ආකාරය ඃ-

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011.09.23 වැනි එදිනට හෝ එදිනට පෙර "සභාපති, ප්‍රාදේශීය සභාව, ඉමදූව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අයැදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

(අයැදුම්පත් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක් ;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ; (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගේ විය යුතුය.)
(v) වෘත්තීය පලපුරුද්ද පිළිබඳ සහතිකය;
(vi) සේවා සහතිකය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි)

09. මෙම අයැදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ඒ. වී. සරත් කුමාර,
සභාපති,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ ඉමදූව ප්‍රාදේශීය සභාවේ ......................................... තනතුරට බඳවා ගැනීම***

01. *(අ)* මුලකුරු සමඟ නම :————.
*(ආ)* මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:—————.
*(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :—————.
03. ස්ත්‍රී/පුරුෂභාවය :—————.
04. *(අ)* උපන් දිනය :—————.
*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:———, මාස:———, දින:———.
05. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
06. විවාහක/අවිවාහක බව :—————.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන බව? :—————.
08. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද ? එසේ නම් විස්තර :—————.
09. අධ්‍යාපන සුදුසුකම්:———.
*(අ)* විභාගයේ නම :—————.
*(ආ)* විභාග අංකය :—————.
*(ඇ)* සමත් වර්ෂය :—————.
(ඈ) සමත් විෂයයන් :—————.
10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :———.
11. ඔබ දැනටමත් මෙහි ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය හා විස්තර එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/දීමනා/ආදේශක සඳහා ද යන වග)
12. වෙනත් සුදුසුකම් :—————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරු තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟවන බවත් දැනට ................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

———————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

09-159

---

**ගලේවෙල ප්‍රාදේශීය සභාව**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් ගලේවෙල ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක හා තාවකාලික පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ.

**උපලේඛනය**

| *තනතුර* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපනික සුදුසුකම්* |
|---|---|---|---|---|
| පොම්ප ක්‍රියාකරු | III | 01 | 6/2006(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පී.එල්. 2-2006ඒ අනුව රු. 12,210-10x130-10x145-10x160-12x170-18,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

| *තනතුර* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපනික සුදුසුකම්* |
|---|---|---|---|---|
| මාර්ග කම්කරු | III | 01 | 6/2006(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පී.එල්. 1-2006 ඒ අනුව රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600. (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| සෞඛ්‍ය කම්කරු | III | 01 | 6/2006(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පී.එල්. 1-2006 ඒ අනුව රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී සිටිය යුතු ය. |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර තුනක් (3) ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කර තිබිය යුතුය.)
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. (දැනට මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
5. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යය තත්ත්වයකින් යුත් අයෙකු විය යුතු ය.
6. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.
7. පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් එම තනතුරට අදාළ පළපුරුද්දක් හෝ පුහුණුවක් ලබා තිබේ නම් එය විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසු අය තෝරා ගනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011 සැප්තැම්බර් මස 15 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, ගලේවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "........................................ (තනතුරේ නම) තනතුර" අයදුම්පත සඳහා යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපත් එවිය යුතු ය.*

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික ,
03. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
04. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ,
05. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
06. දැනට සේවයේ යෙදී සිටී නම් සේවයේ යෙදී සිටින බවට සහතික.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

01. උපලේඛනයේ සඳහන් සියලු තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
02. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසි වලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද ගලේවෙල ප්‍රාදේශීය සභාව නිකුත් කරන නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයන් බැඳී සිටිය යුතු ය. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ගලේවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ආර්. කුලසිංහ,
ලේකම්,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 16 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ගලේවෙල ප්‍රාදේශීය සභාවේ ................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. *(අ)* මුලකුරු සමග නම :——————.
    *(ආ)* සම්පූර්ණ නම :——————.
02. ලිපිනය :——————.
03. උපන් දිනය ඃ අවුරුද්ද:——————. මාසය:——————. දිනය:——————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
05. විවාහක/අවිවාහක බව:——————.
06. ජාතිය:——————. .
07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.
08. අධ්‍යාපන සුදුසුකම්:——————.
    (සහතිකවල පිටපත් අමුණන්න)
09. ඔබ දැනටමත් මෙම ආදේශක සේවයේ යෙදෙන්නේ නම් සේවා කාලය සහ විස්තර :——————.
    (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම ද යන වග) :——————.
10. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————. .

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————. .

09-117

---

# පළාත් පාලන නිවේදන

**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-5(1) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම, සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදූර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2010 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2011 වර්ෂය සඳහා ලෙස පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට තුනක (3%) වරිපනමක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම් එකී ප්‍රාදේශීය ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් බලංගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

09-118/1

---

## සංශෝධනයයි

### රඹුක්කන ප්‍රාදේශීය සභාව

2011.01.14 දිනැති අංක 1689 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස - පළාත් පාලනය කොටසේ පළාත් පාලන නිවේදනය මාතෘකාව යටතේ මං මාවත් පවරා ගැනීමේදී, මාර්ගවල දිග සහ පළල පහත පරිදි සංශෝධනය විය යුතුයි :

| | *මාර්ගයේ නම* | *දිග* | *පළල* |
|---|---|---|---|
| (i) | දලුග්ගල බෝධිරාජාරාම මාවත - පළමු පටුමග | අඩි 640 | අඩි 12 |
| (ii) | ගංගොඩ වත්තේගම පාර සිට අතුරු මාවත දුම්රිය මාර්ගය දක්වා පාර | අඩි 1035 | අඩි 12 |
| (iii) | දිද්දෙනිය වත්ත මාර්ගය | අඩි 188 | අඩි 12 |

ආර්. ඩී. නලින් පුෂ්පකුමාර,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

09-59

---

### කෑගල්ල නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2012 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන මෙන් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව, කෑගල්ල.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/ පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල් අංක 167/28, ඔලගම, කෑගල්ල | සභාපති | බිලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152, කළුගල්ල මාවත, කෑගල්ල |

09-163

# විවිධ දැන්වීම්

## බලංගොඩ ප්‍රාදේශීය සභාව

### 2011 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-5(3) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදූර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බලංගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බලංගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු . අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ* | *රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.* |
| 1. | ගඩොල් හා උළු නිපදවා විකිණීම | 300 0 | 600 0 | 800 0 |
| 2. | ගල් කැට කිරීම හෝ ඔප දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | සිමෙන්ති ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | මස් පිණිස කුකුළන් ඇති කිරීම | 300 0 | 600 0 | 800 0 |
| 5. | වැල්ඩින් වැඩ කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 6. | වඩු කර්මාන්තය | 300 0 | 600 0 | 800 0 |
| 7. | ගෘහ භාණ්ඩ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | දර විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 9. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 10. | වාත්තු කර්මාන්තය | 300 0 | 600 0 | 800 0 |
| 11. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රස කැවිලි නිපදවීම හා විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 13. | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම | 300 0 | 600 0 | 800 0 |
| 14. | විදුලි හා විද්‍යුත් උපකරණ විකිණීම | 300 0 | 600 0 | 800 0 |
| 15. | හිස් ගෝනි මිලට ගෙන විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 16. | පොත්පත් හෝ ලිපිද්‍රව්‍ය විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 17. | බටහිර ඖෂධ විකිණීම | 300 0 | 600 0 | 1,000 0 |
| 18. | ආයුර්වේද ඖෂධ විකිණීම | 300 0 | 600 0 | 1,000 0 |
| 19. | මෝටර් රථ අමතර කොටස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | කෘත්‍රිම දත් බැදීම | 300 0 | 600 0 | 800 0 |
| 21. | ඇස් කණ්ණාඩි විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 22. | ගීත තැටිගත කිරීම, පටිගත කිරීම හා විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 23. | ඇඳුම් මැසීම හා විකිණීම | 300 0 | 550 0 | 1,000 0 |
| 24. | කුෂන් වැඩ කිරීම | 200 0 | 550 0 | 800 0 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු . අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ* | *රු.750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.* |
| 25. | ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 26. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 1,000 0 |
| 27. | පාපැදි අමතර කොටස් හෝ බයිසිකල් විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 28. | පින්තූර රාමු කිරීම | 200 0 | 550 0 | 800 0 |
| 29. | එළවලු හා පළතුරු විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 30. | කෘත්‍රිම පොහොර හෝ කෘමිනාශක විකිණීම | 300 0 | 600 0 | 800 0 |
| 31. | මිරිස්, කෝපි, පිටි හා වෙනත් ධාන්‍ය වර්ග ඇඹරීම | 300 0 | 550 0 | 800 0 |
| 32. | අත් යන්ත්‍ර මගින් හෝ යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන ලී ඉරුම්හලක් හෝ ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | මෝටර් ගරාජයක් හෝ මෝටර් රථ සර්විස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කෙයොලින් මැටි සහ කැල්සයිඩ් කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | විසිතුරු පැල හා මල් විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 36. | සබන් නිපදවීම හා විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 37. | තේ කුඩු පැකට් කිරීම හා විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 38. | ලොතරැයි අලෙවි කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 39. | පුවත්පත් විකිණීම | 200 0 | 600 0 | 800 0 |
| 40. | බිත්තර විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 41. | අත් ටයිල් නිපදවීම හා විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 42. | මනාලියන් හැඩගැන්වීම හා රූපලාවන්‍ය කටයුතු කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 43. | වැලි එක්රැස් කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | මී කිරි හෝ එළකිරි මුදවා විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 45. | නාමපුවරු අකුරු ඇඳීම | 300 0 | 600 0 | 800 0 |
| 46. | මැටි භාණ්ඩ නිපදවීම හා විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 47. | අවමංගල භාණ්ඩ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | උත්සව භාණ්ඩ කුලියට දීම | 300 0 | 600 0 | 800 0 |
| 49. | සංනිවේදන කටයුතු කිරීම | 300 0 | 600 0 | 800 0 |
| 50. | ශීත කරන ලද මස්-මාළු විකිණීම | 200 0 | 550 0 | 800 0 |
| 51. | වී කෙටීම හා විකිණීම | 300 0 | 550 0 | 800 0 |
| 52. | මුද්‍රණ කටයුතු කිරීම | 300 0 | 550 0 | 800 0 |
| 53. | ඇඟලුම් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ටයිල් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | තේ දළු ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |

09-118/3

---

**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-5(4) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2011 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද, 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බලංගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බලංගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *රු. ශත* |
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

09-118/4

---

**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-1(6) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බදු, සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද, ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

*(අ)* හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2011 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV "ආ " වැනි කොටසේ 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2011 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද බලංගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

09-118/5

---

**බලංගොඩ ප්‍රාදේශීය සභාව**

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2011 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-5 (2) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලංගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයේ දී බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සුනිල් ප්‍රේමසිරි,
සභාපති,
බලංගොඩ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
බලංගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලංගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට බලංගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ.* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ.* |
| 1. | උකස්කරුවන් | 500 | 750 | 1,000 |
| 2. | ශබ්දවාහිනී ක්‍රියාකරවීම | 500 | 750 | 1,000 |
| 3. | හෝටල් | 500 | 750 | 1,000 |
| 4. | බත් කඩ, ආපන ශාලා සහ තේ, කෝපි කඩ | 500 | 750 | 1,000 |
| 5. | බේකරි | 500 | 750 | 1,000 |
| 6. | කිරි පට්ටි හා කිරි වෙළඳාම | 500 | 750 | 1,000 |
| 7. | ආහාර විකිණීම | 500 | 750 | 1,000 |
| 8. | මාළු විකිණීම | 500 | 750 | 1,000 |
| 9. | මස් විකිණීම | 500 | 750 | 1,000 |
| 10. | අයිස් කර්මාන්ත ශාලා | 500 | 750 | 1,000 |
| 11. | සිසිල් බීම කර්මාන්ත ශාලා | 500 | 750 | 1,000 |
| 12. | ලොන්ඩරි | 500 | 750 | 1,000 |
| 13. | සංචාරක වෙළෙන්දෝ | 500 | 750 | 1,000 |
| 14. | ගව ගාල් | 500 | 750 | 1,000 |
| 15. | බාබර් සාප්පුවක් | 500 | 750 | 1,000 |
| 16. | ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම | 500 | 750 | 1,000 |

09-118/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2011.10.07 | සිකුරාදා | 2011.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.14 | සිකුරාදා | 2011.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.21 | සිකුරාදා | 2011.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.10.28 | සිකුරාදා | 2011.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2011.11.04 | සිකුරාදා | 2011.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.11 | සිකුරාදා | 2011.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.18 | සිකුරාදා | 2011.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.11.25 | සිකුරාදා | 2011.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.